# ම ව ඥ ති ය

සංස්කරණ:
ඇම්. ගෝමිපලා

1966.12.14

122813

සිංහල සාහිත්‍යයේ පැරණි ග්‍රන්ථාරූඪ ශී කාව්‍ය කෘතීන් අතුරෙන් දැනට අපට ඉතිරිව ඇත්තේ "සව්සත්දම් සූදාව", "සසදාව", "මුවදෙව්දාව" යන තුන යි. මෙහු රචිත කාලය පිළිබඳ නිර්ණයකට බැසගැන්මට වෙතෙත් හැකි වී ඇත්තේ සසදාවත් සව්සත්දම්හේ පමණකි. සසදාව ලියාවති රාජිය ගේ කාලයටත්, සව්සත්දම් කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත පරාක්‍රමබාහු නරේන්ද්‍රයා ගේ කාලයට ඇතුළත් කිරීමට යෑහෙන තරම් සාධක දැනට විද්වතුන් විසින් ඉදිරිපත් කර ඇත. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා විසින් මෑතදී සොයාගත් ලැබූ ශිලා ලේඛනයක් නිසා සව්සත්දම්ගේ සඳහන් "අඩු ගුණු පරපුරෙන කලිකල් සවැනි කිරිඳු" පිළිබඳ නිර්ණයකට බැසීමට මගක් එළියක් ලැබී ඇති බැව් පිළිගත යුතු ය. එහෙත් මුවදෙව්දාව පිළිබඳව නම් එබඳු ලිපියක් හිසි ම තැනකින් මෙතෙක් ලැබී නැත.

මේ ග්‍රන්ථයට විවරණයක් සැපයූ මුනිදාස කුමාරණතුංග මහතා එහි ප්‍රථම සංස්කරණයේදී මුවදෙව්දාව සී පොත් තුනෙන් මුල් ම කෘතිය විය හැකි බවත්, දෙවන සංස්කරණයේදී මෙය සසදාවට පසුව කරන ලද බවත් අනුමාන කළේ ය. මුවදෙව්දා කාරයන් ගේ කාලය විනිශ්චය කළ නො හැකි බව එතුමෝ අවසන් වශයෙන් පිළිගත්හ.

සතු කවෙහි ආශයය තදින් ම ලැබීමත්, කාව්‍යයට මුල් වූ කථා ප්‍රවෘත්තිය තෝරා ගත් ආකාරයත් බලනවිට එය පොළොන්නරු යුගයට අයත් ග්‍රන්ථයක් විය හැකි බව පුංචිබණ්ඩාර සන්නස්ගල ආදී බොහෝ විද්වත්හු අනුමානය කරති. එය ම ගරම් පසුවෙන් ලිවන ලිය හැකි අදහසක් නො වෙතත් ග්‍රන්ථය රචිත කාලය පිළිබඳව නිශ්චිත නිගමනයකට බැසීමට එය ම ප්‍රමාණවත් නො වේ. සමකාලීන කෘතීන් ගේ භාෂා විලාසය අනුව සාහිත්‍ය ග්‍රන්ථයක කාලය මැනීමේ ක්‍රමය ද අප අතර සම්භාවිත නමුදු, අපේ පද්‍ය කෘතීන් අනුගමනය කර ඇති භාෂා සම්ප්‍රදාය අනුව එය ද අවදානම් සහිත ය. අපේ කවීන් පද්‍ය රචනය සඳහා උපයෝගී කර ගෙන ඇත්තේ තත්කාලීන ව්‍යවහාරයේ පැවති භාෂාව ම නො වේ. එක ම කාලයක තුළ රචිත ගද්‍ය හා පද්‍ය භාෂාව අතර ලොකු වෙනසක් ඇති බව සාට වුව ද ඉතා පැහැදිලි ය. පද්‍ය රචනයේදී හුදු ශෛලී වදන් ම භාවිත වූ අතර, කෘතිය කෘතීන් සඳහා පැරණි හෝ නවීන භාෂා ව්‍යවහාරයන් තෝරා ගැනීම රචකයා ගේ රුචිය අනුව සිදු වුවකි.

පොළොන්නරු යුගයේදී සංස්කෘත ග්‍රන්ථයන් හැදෑරීම බහුලව පැවති බව එතෙකොට ම පිළිගත හැකි නමුදු, මුල් යුගයේ සිට ම සකුව හැදෑරීම ලෝදිව සිංහලුනට බොහෝ සාධක ඉදිරිපත් කළ හැකි ය.